# අවසාන වාර පරීක්ෂණය -10 ශ්‍රේණිය - www.eduLanka.LK

## බුද්ධ ධර්මය - 1 පත්‍රය

කාලය පැය 1 යි

1. ත්‍රි ලක්ෂණයට අයත් නොවන්නේ
   1 ) අනිත්‍ය ලක්ෂණය 2 ) අවිද්‍යා ලක්ෂණය 3 ) අනාත්ම ලක්ෂණය 4 ) දුක්ඛ ලක්ෂණය
2. අනත්ත ලක්ඛණ සූත්‍රය දේශනා කලේ
   1 ) කොසොල් රජ තුමාට 2 ) යසකුල පුත්‍රයාට 3 ) පස්වග මහනුන්ට 4 ) සැරියුත් හිමියන්ට
3. මිනිස්සු උස් පහත් වශයෙන් වෙනස්ව උපත ලබනුයේ කවර හෙයින්ද ? මෙවැනි ප්‍රශ්ණයක් ඇතිවූයේ
   1 ) යසකුල පුත්‍රයාට 2 ) රාහුල කුමාරයාට 3 ) ආනන්ද හාමුදුරුවන්ට 4 ) සුභ නම් තරුණයාට
4. ආර්ය අශ්ටාංගික මාර්ගයේ නිවැරදි දිවි පැවැත්ම පිළිබඳව කියවෙනුයේ
   1 ) සම්මා දිට්ටි යනුවෙනි 2 ) සම්මා සංකප්ප යනුවෙනි
   3 ) සම්මා ආජීව යනුවෙනි 4 ) සම්මා කම්මන්ත යනුවෙනි
5. ත්‍රී ශික්ෂාව ලෙස හඳුන්වන්නේ
   1 ) අනිත්‍ය දුක්ඛ අනාත්ම 2 ) ලෝභ දෝෂ මෝහ 3 ) සිත කය වචනය 4 ) සීල සමාධි ප්‍රඥා
6. කාලගුණික වෙනස්කම් හේතු ඵල අනුව සිදුවීම පිළිබඳව කියවෙනුයේ
   1 ) බීජ නියාමයෙනි 2 ) උතු නියාමයෙනි 3 ) කම්ම නියාමයෙනි 4 ) ධම්ම නියාමයෙනි
7. කාමලෝක ගනන වන්නේ
   1 ) දහයකි 2 ) පහකි 3 ) එකොලහකි 4 ) හතරකි
8. මැරෙන මොහොතේදී කරනලද කර්ම පළිබඳව කියවෙන්නේ
   1 ) ආසන්න කර්මයෙනි 2 ) කටත්තා කර්මයෙනි 3 ) ගරුක කර්මයෙනි 4 ) ආචින්න කර්මයෙනි
9. අතීත ආත්මභාව දැකීමේ නුවණ හැදින්වෙන්නේ
   1 ) පුබ්බේනිවාසානුස්සති ඥාණය 2 ) චුතූපපාත ඥාණය
   3 ) ආසවක්ඛය ඥාණය 4 ) අවිද්‍යා ඥණය
10. බුදුරජානන් වහන්සේ උපත ලැබුවේ ක්‍රි පූ
    1 ) අටවන සියවසේදීය 2 ) හතරවන සියවසේදීය 3 ) හයවන සියවසේදීය 4 ) දෙවන සියවසේදීය
11. වප්මගුල් උත්සවය පැවැත්වූයේ සිදුහත් කුමරා ඉපදී
    1 ) හත් දිනකිනි 2 ) පස්මසකිනි 3 ) තුන් මසකිනි 4 ) හය මසකිනි
12. බුදුරජානන් වහන්සේ සත් සතිය තුල පස්වන සතිය ගතකලේ
    1 ) අනිමිසලෝචන පූජාව 2 ) මුචලින්ද නා රජ සෙවන 3 ) රුවන්ගෙය 4 ) අජපාල නුග රුක මුල
13. ප්‍රථම ධර්ම දේශනාව පැවැත්වීමට පස්වග මහනුන් සොයා ගියේ
    1 ) උරුවෙල් ජනපදයට 2 ) සැවැත් නුවරට 3 ) බරණැස ඉසිපතනයට 4 ) නේරංජනා ගඟ අසබඩට
14. බිම්බිසාර රජතුමා විසින් බුදු රජාණන් වහන්සේට පූජා කල ආරාමය
    1 ) ජේතවනාරාමය 2 ) පූර්වාරාමය 3 ) වේළුවනාරාමය 4 ) ඉසිපතනාරාමය
15. බුදුරජාණන් වහන්සේගේ දින චරියාවේ දෙව් බඹුන්ට දහම් දෙසීම සඳහා වෙන්වූයේ
    1 ) මැදියම් කිස 2 ) පෙරයම් කිස 3 ) පෙරබත් කිස 4 ) පසුබත් කිස
16. බුදුරජාණන් වහන්සේගේ කියන දේ කරන ගුණය හැදින්වූයේ
    1) පුරිස ධම්ම සාරතී ගුණය 2) යථාකාරී තථාවාදී ගුණය 3) යථාවාදී තථාකාරී ගුණය 4) අරහං ගුණය
17. බමුණ , ඔබගේ නිවසට පැමිණෙන ආගන්තුකයන් සඳහා පිළියෙල කරන ලද සංග්‍රහයක් ඔවුන් නොපිළිගත්තේ නම් ඔය ඔබටම වන්නාක් මෙන් ඔබගේ සංග්‍රහය නොපිළිගන්නා බැවින් එය නැවතත් ඔබටම වේ මෙසේ බුදුරජාණන් වහන්සේ ප්‍රකාශ කලේ

1) උපාලි ගෘහපතියාට 2) අක්කෝස භාරද්වාජ බමුණාට 3) සුභද්ද පරිබ්‍රාජකයාට 4) සෝණදණ්ඩ බමුණාට

18. ආරාධනාකොට වැඩමවා සිවුපසය පුද කිරීමට සුදුසු මෙම ගුණය හැඳින්වෙන්නේ
1 ) පාහුණෙය්‍ය ගුණය නමිනි 2 ) දක්ඛිණෙය්‍ය ගුණය නමිනි
3 ) අඤ්ජලිකරණීය ගුණය නමිනි 4 ) ආහුණෙය්‍ය ගුණය නමිනි

19. පංච නීවරණවල දැඩි තරඟ හැඳින්වීමට යොදන පදය වනුයේ
1 ) ව්‍යාපාද 2 ) කාමච්ඡන්ද 3 ) ථිනමිද්ධ 4 ) උද්ධච්ච කුක්කුච්ච

20. දුටුගැමුණු රජතුමා කොපමණ කාලයක් රජකම කරන ලද්දේද ?
1 ) අවු 60 2 ) අවු 40 3 ) අවු 30 4 ) අවු 24

21. කරණීය මෙත්ත සූත්‍රයේ මෙත් වඩන්නෙකු කුල ඇති විය යුතු නුවණැති වීම යන ගුණාංගය හඳුන්වන්නේ
1 ) සක්කෝ 2 ) සුභරෝ 3 ) නිපකෝ 4 ) සුවචෝ

22. ලෝක පාලක ධර්ම යනු
1 ) තණ්හාව හා ආශාවයි 2 ) ලෝභය හා ද්වේෂයයි
3 ) සීලය හා සමාධියයි 4 ) පව් කිරීමට ඇති ලැජ්ජාව හා බයයි

23. සිඟාලෝවාද සූත්‍රයේ දිසා නමස්කාරයේදී ගුරුවරු අයත්වන්නේ
1 ) උතුරු දිශාවටයි 2 ) දකුණු දිශාවටයි 3 ) බටහිර දිශාවටයි 4 ) නැගෙනහිර දිශාවටයි

24. බුද්ධත්වය සඳහා වූආර්ය පර්යේෂණය ගැන කියවෙන සූත්‍රය
1 ) සිඟාලෝවාද සූත්‍රයයි 2 ) කලාම සූත්‍රයයි 3 ) අරිය පරියේෂණ සූත්‍රයයි 4 ) රතන සූත්‍රයයි

25. මගේ ශරීරය රෝගී වුවත් සිත නිරෝගී විය යුතු යැයි සිතා ඒ අනුව කටයුතු කරන්නැයි බුදුරජාණන් වහන්සේ පැවසුවේ
1 ) කොසොල් රජතුමාට 2 ) රාහුල කුමාරයාට 3 ) උපාලි ගෘහපතියාට 4 ) නකුලපිතා ගෘහපතිට

26. දෙවන ධර්ම සංගායනාව පැවැත්වූයේ බුද්ධ පරිනිර්වානයෙන්
1 ) අවු 100 කට පසු 2 ) අවු 200 කට පසු 3 ) අවු 236 කට පසු 4 ) අවු 300 කට පසු

27. ත්‍රිපිටකය ග්‍රන්ථාරූඪ කලේ
1 ) කැළණි විහාරයේ දී 2 ) පැපිලියාන සුනේත්‍රා දේවි පිරිවෙනේදී
3 ) ලෝවා මහාපායේදී 4 ) මාතලේ අළු විහාරේදී

28. ලංකාවේ මුල්ම ස්තූපය නම්
1 ) ථූපාරාමයයි 2 ) අභයගිරියයි 3 ) මහියංගන චෛත්‍යයයි 4 ) ජේතවනාරාමයයි

29. විහාරස්ථානයකට ගොස් මුලින්ම වැඳිය යුත්තේ
1 ) බුදු පිළිමයටයි 2 ) චෛත්‍යයටයි 3 ) ස්වාමින් වහන්සේටයි 4 ) බෝධීන් වහන්සේටයි

30. ස්තූපයක ආරක්ෂාව සඳහා එය වටකොට තනනු ලබන ගොඩනැගිල්ල
1 ) වාහල්කඩ නම්වේ 2 ) සඳකඩ පහණ නම්වේ 3 ) වටදාගෙය නම්වේ 4 ) සලපතල මළුව නම්වේ

31. වළගම්බා රජු දවස ඇතිවූ දැඩි නියගය හා සාගතය කොපමණ කලක් පැවතුනේද ?
1 ) අවු 7 කි 2 ) අවු 6 කි 3 ) අවු 9 කි 4 ) අවු 12 කි

32. සෙන් නැමැති උද්‍යාන පිහිටා ඇත්තේ
1 ) චීනයේය 2 ) ටිබෙට් දේශයේය 3 ) ඉන්දියාවේය 4 )ජපානයේය

33. තමා උපමා කොට වරදින් වැලකීමේ ක්‍රමය හඳුන්වනුයේ
1 ) අත්තාධිපංකයය යනුවෙනි 2 ) දේව ධර්මය යනුවෙනි
3 ) අත්තූපනායික ධර්මය යනුවෙනි 4 ) හේතු ඵල දහම යනුවෙනි

34. තමාට හානිය පිණිස පවතින අනුන්ට හානිය පිණිස පවතින තමන්ට හා අනුන්ට දෙපිරිසටම හානිය පිණිස පවතින ක්‍රියා වලින් වැලකිය යුතු යැයි බුදුරජාණන් වහන්සේ දේශනා කලේ
1 ) නන්ද කුමාරයාට 2 ) රාහුල කුමාරයාට
3 ) ආනන්ද හාමුදුරුවන්ට 4 ) මහා ප්‍රජාපතී ගෝතමී දේවියට

35. ත්‍රී ශික්ෂාව යනු

www.eduLanka.Lk

1 ) සීල සමාධි ප්‍රඥා 2 ) සිත කය වචනය
3 ) ලෝභ ද්වේෂ මෝහ 4 ) මෙත්තා කරුණා මුදිතා යන අංග තුනයි

36. ප්‍රඥාව වැඩීමටත් නිවන අවබෝධ කර ගැනීමටත් වැඩිය යුතු භාවනාව නම්
1 ) මෛත්‍රී භාවනාවයි 2 ) සමථ භාවනාවයි 3 ) ආනාපානසති භාවනාවයි 4 ) විදර්ශනා භාවනාවයි

37. අපට හොඳ නරක ක්‍රියාවන් වෙන්කර හඳුනා ගැනීමට හැකියාවක් තිබේ එය
1 ) සම්මා සතියයි 2 ) සම්මා දිට්ඨියයි 3 ) සම්මා ආජීවයයි 4 ) සම්මා වායාමයයි

38. යමෙක් මෙලොව උසස් යැයි සම්මත කුලයක ඉපිද ප්‍රාණඝාතාදී අකුශල කර්ම කරන්නේ නම් ඔහු සැබැවින්ම
1 ) උත්තමයෙකි 2 ) පණ්ඩිතයෙකි 3 ) වසලයෙකි 4 ) කුලවතෙකි

39. විවිධ විෂම සමාජයන් තුල වරදෙහි හා දුසිරිත්වල නොගැටී ජීවත් වීම බුද්ධ දේශනාවට අනුව
1 ) පින්බර ජීවිතයකි 2 ) සත්පුරුෂ ජීවිතයකි 3 ) පද්මාකාර ජීවිතයකි 4 ) ධාර්මික ජීවිතයකි

40. සිඟාලෝවාද සූත්‍රයෙහි සදිසා වල එන යුතුකම් තුලින් ආභරණ ආදිය ගෙනවිත් දීම
1 ) භාර්යාවගේ යුතු කමකි 2 ) මිතුරියගේ යුතුකමකි
3 ) ස්වාමි පුරුෂයාගේ යුතුකමකි 4 ) දෙමාපිය යුතුකමකි

www.eduLanka.LK



ඉස්කෝලේ edulanka.lk

# අවසාන වාර පරීක්ෂණය 10 ශ්‍රේණිය

## බුද්ධ ධර්මය - 11 පත්‍රය

කාලය පැය 2 යි

පළමු ප්‍රශ්නය ඇතුළු ප්‍රශ්න 4 කට පිළිතුරු සපයන්න. (පළමු ප්‍රශ්නය අනිවාර්යයයි)

1. දුටුගැමුණු රජතුමා පිළිබඳව ලියන ලද රචනාව සිහියට නගාගන්න
   1) දුටුගැමුණු රජතුමාගේ දෙමව්පියන් නම් කරන්න
   11) දුටුගැමුණු රජතුමා තම පියා වෙත ස්ත්‍රී ආභරණ යැව්වේ ඇයි?
   111) දුටුගැමුණු රජු විසින් ඉදි කරන ලද චෛත්‍ය දෙකක් ලියන්න
   1v) ලෝවාමහාපාය මහල් කීයක ගොඩනැගිල්ලක්ද?
   v) දුටුගැමුණු රජතුමා සටන්කොට ජය ගත්තේ කුමන රජතුමා සමගද?
   v1) දුටුගැමුණු රජතුමාගේ රාජ්‍ය කාලය කොපමණද?
   v11) දුටුගැමුණු රජතුමාගේ චරිතයෙහි ඇති විශේෂ ලක්ෂණ මොනවාද?
   v111) මිරිස් ආහාරයක් සංඝයා වහන්සේට පූජා කිරීමට අමතකව යෑමෙන් තමාටම දඬුවම් දෙනු පිණිස සෑදවූ චෛත්‍යය කුමක්ද?
2. 1) අ) හතරවෙනි ධර්ම සංගායනාව පැවැත්වූයේ කුමන ස්ථානයකද?
   ආ) මෙම ධර්ම සංගායනාව පැවැත්වූයේ කුමන රජතුමාගේ කාලයේද?
   11) හතරවෙනි ධර්ම සංගායනාව පැවැත්වීමට හේතු මොනවාද?
   111) හතරවෙනි ධර්ම සංගායනාවේ ප්‍රතිඵල මොනවාද?
3. 1) සිඟාලෝවාද සූත්‍රයේ සඳහන් දිශා හය මොනවාද?
   11) යහපත් සේවකයෙකු විසින් තම ස්වාමියාට ඉටු කල යුතු යුතුකම් කවරේද?
   111) යම් ආයතනයක ස්වාමියා හා සේවකයා අතර ඇති යහපත් සම්බන්ධය බිඳ වැටීමෙන් ඇතිවන ගැටළු මොනවාද?
4. 1) බුදුරජාණන් වහන්සේගේ දින චරියාව ලියන්න
   11) බුදුරජාණන් වහන්සේගේ චරිතයෙන් අපට ගතහැකි ආදර්ශ මොනවාද?
   111) කාල සටහනකට අනුව වැඩ කිරීමෙන් ලැබෙන ප්‍රයෝජන ලියන්න
5. 1) භාවනාවේ ප්‍රභේද දෙක ලියන්න
   11) සිත එක්තැන් කරගැනීමට ඉවහල් වන්නේ කුමන භාවනාවද ?
   111) පාසල් ශිෂ්‍යයෙක් වශයෙන් භාවනාව වැඩීමෙන් ලැබෙන ප්‍රයෝජන මොනවාද?
6. 1) මගේ ශරීරය රෝගි වුවත් සිත නිරෝගි විය යුතුයැ ඒ අනුව කටයුතු කරන්න බුදුරජානන් වහන්සේ පැවසුවේ කා හටද?
   11) නිරෝගිබව උදෙසා බුදුරජානන් වහන්සේ දුන් උපදෙස් මොනවාද?
   111) නිරෝගි බව උදෙසා අපට අනුගමනය කළහැකි ක්‍රියා මාර්ග මොනවාද?
7. 1) සබ්බේ තසන්ති දණ්ඩස්ස - සබ්බේ භායන්ති මච්චුනෝ
   උත්තානං උපමං කත්වා - නහනෙය්‍ය නඝාතයේ
   මෙම ගාථාවේ තේරුම ලියන්න
   11) අත්තූපනායික ධර්මය හඳුන්වන්න
   111) සමාජය තුල ප්‍රචණ්ඩ ක්‍රියා ඇතිවන විට ලැබෙන අයහපත් ප්‍රතිඵල මොනවාද?



www.eduLanka.LK

www.eduLanka.LK